# සඳුනිට මුණගැසුණු බලු පැටියා



ඉමන්දි කරුණාතිලක

කෘතියේ නම : සඳුනිට මුණගැසුණු බලු පැටියා

කතෘගේ නම : ඉමන්දි කරුණාතිලක

ප්‍රකාශිත දිනය : 2025.02.22

ISBN අංකය 978-624-208-610-1

## පිදුම

**මා හට අකුරු කරන්නට**

**මඟ පෙන් වූ**

**දයාබර ගුරු දෙගුරුන්ට**

**බැති සිතින් පුදමි..**

## පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුලින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුල පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂී සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදී කතෘ කරුදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුල යලි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමු කරන හෙරණගත්කරණී ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛණකරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගතද දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය

ශශිකලා සේනාධීර



ඔන්න දවසක් සඳුනි පාසල් ඇරිලා ගෙදර එද්දි පුංචි කෙඳිරිලි ශබ්දයක් ඇසුණා. සඳුනි ඒ ශබ්දය කොහෙන්ද එන්නෙ කියලා බැලුවා. ඒ ශබ්දය එන්නෙ කාණුව පැත්තෙන්.



සඳුනි කාණුව ලඟට ගිහින් බැලුවා. අනේ පුංචි බලු පැටියෙක් වැටිලා ඉන්නවා සඳුනි දැක්කා. එයාට ගොඩක් දුක හිතුණා බලු පැටියා ගැන.



සඳුනි බලු පැටියා වඩාගෙන ගෙදර එක්ක ගියා.සඳුනිගේ අම්මා ඇහුවා කොහෙන් ද මේ බලු පැටියා ගෙනාවෙ කියලා. අම්මා මම එනකොට මේ බලු පැටියා කාණුවේ වැටිලා හිටියා. මට දුක හිතිලා මම එයාව ගෙදර ගෙනාවා කියලා සඳුනි කිව්වා.



එයාගේ ඇඟේ හොඳට ම මඩ ගෑවිලා.අපි එයාව නාවමු ද? කියලා සඳුනි අම්මාගෙන් ඇහුවා. අම්මයි සඳුනියි එකතුවෙලා බලු පැටියව නෑව්වා.






සඳුනි බලු පැටියට කිරි කෝප්පයක් ම හදලා දුන්නා. අම්මේ අපි මෙයාට නමක් දාමු ද? හා පුතේ මොකක්ද දාන නම? ලකී කියන නම දාමු ද අම්මා කියල සඳුනි ඇහුවා. ඒ නම හොඳයි කියල අම්මා කිව්වා.



සඳුනිගෙ තාත්තා හවස ගෙදර ආවා ම සඳුනි ලකීව පෙන්නුවා. තාත්තා ලකීට බෙහෙත් විදින්න එක්ක ගියා.







සඳුනි ලකීට හරි ම ආදරෙයි. සඳුනි ඉස්කෝලේ ඇරිල එනකන් ලකී හැමදාම මඟ බලාගෙන ඉන්නවා.

සඳුනිත් හැමදාම ඉස්කෝලේ ඇරිලා
ගෙදර ආවා ම හවස්වෙනකන් ලකී එක්ක
සෙල්ලම් කරනවා.



ගෙදර කවුරුත් නැති වෙලාවට ලකී ගෙදර බලාගන්නවා.වෙන කාටවත් එන්න දෙන්නේ නෑ.





පුංචි අපිත් සඳුනි වගේ අසරණ සතුන්ට උදව් කරමු.

# පසුවදන

රටේ අනාගතය සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දලුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩ පාසල් කලාප,පළාත්,ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන් දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමග දරුවන් එයින් දුරස් වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජ සමාජය තල විවිධ ගැටලු ප්‍රශ්ණ නිර්මාණය වීමට හේත වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණයේ සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසග, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුලින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛණ දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධිකාරක,

සෙනෙවිරත්න මහලේකම්